# අංගුත්තර නිකාය

චතුක්ක නිපාතය

## භණ්ඩගාම හා චක්ක වග්ග

සංස්කාරක

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
කොළඹ මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙණේ ආචාර්ය

**මකුරුප්පේ ධම්මානන්ද හිමි**

# පෙරවදන

අංගුත්තර නිකාය සූත්‍ර පිටකයේ සිවු වන නිකාය ග්‍රන්ථයයි. මෙම කෘතිය සැකසී ඇත්තේ සංඛ්‍යාත්මක ක්‍රමවේදයකට අනුව ය. ඒකක නිපාත, දුක නිපාත, තික නිපාත, චතුක්ක නිපාත යනාදී වශයෙන් එකේ ධර්ම කොටස් (ඒකකනිපාතය) දෙකේ ධර්ම කොටස් (දුකනිපාතය) තුනේ ධර්ම කොටස් (තිකනිපාතය) හා හතරේ ධර්ම කොටස් (චතුක්කනිපාතය) ආදී වශයෙන් එකොළොස් වන කොටස (එකාදසනිපාතය) දක්වා ක්‍රමයෙන් වැඩි වන ධර්ම කොටස් මෙහි සංග්‍රහ කොට ඇත. එලෙස එකෙන් එක වැඩි වන නිකාය කෘතිය වන හෙයින් මෙය **ඒකෝත්තරාගම** යනුවෙන් මෙයට සර්වාස්තිවාදීහු නම් කරති. බුද්ධඝෝෂ හිමියන් පෙන්වා දෙන පරිදි මෙයින් ධර්මකථික උතුමන්ට විචිත්‍ර ප්‍රතිභානය ජනනය වේ. **(ධම්මකථිකපුඞ්ගවානං විචිත්තපටිභානජනනස්ස**) එසේම මෙහි **සූත්‍ර නවදහස් පන්සිය පණස් හතක්** ඇත. ‘චිත්තපරියාදානසුත්තාදි නවසුත්තසහස්සපඤ්චසත සත්තපඤ්ඤාසසුත්තසංගහො’ එයින් පළමු වන සූත්‍රය **චිත්තපරියාදාන** සූත්‍රයයි. ඒකක නිපාතයේ වර්ග විස්සක් ද දුක නිපාතයේ වර්ග පසළොසක් ද තික නිපාතයේ වර්ග අටළොසක් ද චතුක්ක නිපාතයේ වර්ග විසි අටක් ද පඤ්චක නිපාතයේ වර්ග විසි හයක් ද ඡක්ක නිපාතයේ වර්ග දහ තුනක් ද අට්ඨක නිපාතයේ වර්ග එකොළොසක් ද නවක නිපාතයේ වර්ග දහයක් ද දසක නිපාතයේ වර්ග තෙවිස්සක් ද ඒකාදසක නිපාතයේ වර්ග හතරක් ද වශයෙන් වර්ග **හැත්තෑ හතරක්** දක්නා ලැබේ. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් තම ත්‍රිපිටක සූචියෙහි පෙන්වා දෙන පරිදි මෙහි ඇත්තේ වර්ග 184 ක් වන අතර සූත්‍ර නව දහස් හත්සිය අනූ එකක් වේ. මෙසේ සංඛ්‍යාත්මක විසදෘශතාවක් පැවතීමට හේතුව ගිණීමේ පවතින අවිශදභාවය ද නො එසේ නම් පශ්චාත්කාලීන ප්‍රවේශ වැනි හේතූන් ද යන්න වෙනම විමසිය යුතු කරුණකි.

අංගුත්තරනිකාය දළ වශයෙන් සංඛ්‍යා ශබ්ද කෝෂයක් මෙනැයි කිව හැකි ය. මෙය මෙසේ සකස් වී ඇත්තේ ධර්මය කට පාඩමෙන් ඉදිරියට පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව නිසා යැයි සිතීම සුදුසු ය. ධර්ම කරුණු එක්තරා පිළිවෙළකට අනුව සංග්‍රහ කිර තිබීම නිසා යම් යම් කරුණු ගිළිහී යාමට තිබූ ඉඩ ගිලිහේ. අනෙක් අතින් මෙසේ කරුණු සංග්‍රහ කොට තිබීම නිසා ධර්ම දේශකයනට ඉතා පහසුවෙන් කරුණු පැහැදිලි කිරීමට ද හැකියාවක් ලැබේ. දීඝනිකායේ මූලික උපයෝගිතාව ශ්‍රද්ධාව ඇති කිරීම බවත් මජ්ඣිමනිකායේ පරවාද මථනය බවත් සංයුත්තනිකායේ ඥාන ප්‍රභේද ජනනය බවත් පවසන බුද්ධඝෝෂ හිමියන් අංගුත්තරනිකාය **ධර්මකථිකයන්ගේ ප්‍රතිභාන ශක්තිය වර්ධනය කරවන** බව පවසා තිබීම මෙහි දී වැදගත් වේ. සැබැවින් ම මෙහි අන්තර්ගත කරුණුවල ඉමහත් වටිනාකමක් ඇති බව ද කිව යුතු ය. නිදසුනක් ලෙස අංගුත්තර නිකායේ ඒකක නිපාතයේ සඳහන් කරුණු අතර "පභස්සරමිදං භික්ඛවෙ චිත්තං, තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං" (මහණෙනි මේ සිත ප්‍රභාස්වරය. එය ද බැහැරින් පැමිණෙන උපක්ලේශයන්ගෙන් කිලිටි වේ.) "නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යො එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ පමාදො" (මහණෙනි යම් ඒ ප්‍රමාදයක් වේද මහත් අනර්ථකර වූ අන් එක් කරුණකුදු නො දකිමි) "එකපුග්ගලස්ස භික්ඛවෙ පුග්ගලස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං? කතමස්ස එකපුග්ගලස්ස, තථාගතස්ස අරහතො සම්මා සම්බුද්ධස්ස" (මහණෙනි ලෝකයෙහි එක් පුද්ගලයෙකුගේ පහළවීම දුර්ලභ ය. කවර එක් පුද්ගලයෙකුගේ ද යත් තථාගත අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ ය.) ‘අමතං තෙ භික්ඛවෙ න පරිභුඤ්ජන්ති, යෙ කායගතාසතිං න පරිභුඤ්ජන්ති’ (මහණෙනි යමෙක් කායගතාසතිය නොවඩත් ද ඔවුහු නිවන භුක්ති නො විඳිති.) මේ හැරුණු විට ඒකක නිපාතයෙහි එතදග්ගපාලිය නමින් හැඳින්වෙන කොටසෙහි බුදුරදුන් විසින් අග තනතුරුවලට පත් කරන ලද ශ්‍රාවකයන්ගේ නම් ඇතුළත් වී තිබීම අතිශය වැදගත් කරුණකි. සැබැවින්ම මෙහි අන්තර්ගත කරුණු ධර්ම ගම්භීරත්වයකින් යුතු බව කීම නිවැරදි ය. චිත්ත, පමාද, තථාගත, කායගතාසති යනාදී පද පිළිබඳ සාරාර්ථය මෙම එක වැකියක ඇතුළත් වී ඇති අයුරු ධර්මඥානය ඇත්තවුන්ගේ සිත් ගනු නො අනුමාන ය. නීවරණප්පහාණ වග්ග, අකම්මනිය වග්ග, අදන්ත වග්ග, අච්ඡරාසඞ්ඝාතවග්ග, පමාදාදිවග්ග යනාදී වශයෙන් ඒ ඒ වර්ගවලට නම් තබා ඇත්තේ ද අන්තර්ගතය පැහැදිලි වන පරිදිය.

අංගුත්තර නිකායේ කේසපුත්තිය හෙවත් කාලාම, අග්ගික්ඛන්ධොපම, දීඝජාණු හෙවත් ව්‍යග්ඝපජ්ජ, භූමිචාල වැනි සුප්‍රසිද්ධ සූත්‍ර රාශියක් ඇත. එසේම සංගාරව වැනි අංගුත්තර නිකායේ අන්තර්ගත ඇතැම් සූත්‍ර ත්‍රිපිටකයේ වෙනත් තැන්වල ද දක්නා ලැබේ. එකම ප්‍රතිග්‍රාහකයෙකුට දෙසූ ඇතැම් සූත්‍ර සුළු සුළු වෙනස්කම් සහිතව සමාන සූත්‍ර නාමයකින් යුතුව වෙනත් විවිධ තැන්වල යෙදෙන අවස්ථා ද බහුලව දක්නා ලැබේ. එසේම සංයුත්තනිකායේ කෝසල සංයුත්තයේ එන පුග්ගල සූත්‍රය හා අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ එන තමොතම සූත්‍රය අන්තර්ගතය විසින් සමානය. මෙයින් පැහැදිලි වන්නේ සංගීතිකාරක මහතෙරුන් විසින් බුද්ධවචනයේ පැවැත්ම උදෙසා මෙම වෙනස්කම් සහිතව එකී සූත්‍ර ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා අනුබල දුන් බවයි. බුද්ධ දේශනාවේ වැදගත් කරුණු මේ නිසා කවර අයුරකින් හෝ ආරක්ෂා වන බව උන්වහන්සේලා දැන සිටියහ.

මිනිසාගේ ඓහලෞකික හා පාරලෞකික අරමුණු මුදුන් පමුණුවා ගැනීමට මෙම ධර්ම කරුණුවලින් ලැබෙන අනුබලය අතිප්‍රබල ය. බුදුන් වහන්සේ විසින් සමාජයේ පුද්ගල චරිත විනිවිද දැක ඒවා විශ්ලේෂණය කොට උත්තරීතර පුද්ගල පෞරුෂත්වයක් ගොඩ නැඟීමට දුන් උපදේශවලින් මෙම කෘතිය පොහොසත් ය. නිදසුනක් ලෙස සාවජ්ජ සූත්‍රය ගත හැකි ය. මහණෙනි, ‘මේ ලෝකයෙහි පුද්ගලයෝ සිවු දෙනෙක් වෙති. ඒ කවරහුද යත්? නරක දේ කරන පුද්ගලයා ය. නරක දේ වැඩිපුර කරන පුද්ගලයා ය. නරක දේ අඩුවෙන් හා හොඳ දේ වැඩියෙන් කරන පුද්ගලයා ය. හොඳ දේ කරන පුද්ගලයා ය යනුවෙනි. ඇතැම් විට උපමා මගින් මෙම පුද්ගල විශ්ලේෂණය කෙරේ.‘ මහණෙනි, අඹ වර්ග හතරකි. එනම්: ඉදුණු පැහැති අමු අඹ ගෙඩි ය, අමු පැහැති ඉදුණු අඹ ගෙඩි ය. අමු පැහැති අමු අඹ ගෙඩි ය. ඉදුණු පැහැති ඉදුණු අඹ ගෙඩි ය යනුවෙනි. මෙපරිද්දෙන්ම මහණෙනි, ලෝකයෙහි පුද්ගලයෝ සිවු දෙනෙක් වෙති.’ අනතුරුව මෙම පුද්ගලයන් සිවු දෙනාගේ ස්වභාවය විස්තර කොට ඇත. ඒ අනුව ප්‍රසන්න ඉඳුරන් ඇති එහෙත් චතුරාර්ය සත්‍යය නො දන්නා පුද්ගලයා ඉදුණු පැහැති අමු අඹ ගෙඩි ය වැනි ය. ප්‍රසන්න ඉඳුරන් නැති එහෙත් චතුරාර්ය සත්‍යය දන්නා පුද්ගලයා අමු පැහැති ඉදුණු අඹ ගෙඩි ය වැනි ය. ප්‍රසන්න ඉඳුරනුත් නැති චතුරාර්ය සත්‍යයත් නො දන්නා පුද්ගලයා අමු පැහැති අමු අඹ ගෙඩි ය වැනි ය. ප්‍රසන්න ඉඳුරන් ද ඇති එසේම චතුරාර්ය සත්‍යය ද දන්නා පුද්ගලයා ඉදුණු පැහැති ඉදුණු අඹ ගෙඩි ය වැනි ය. අධ්‍යාත්ම සංවර්ධනයෙහි ලා මෙම පුද්ගල විභාගය කෙතරම් ප්‍රබල උත්තේජනයක් ඇති කෙරේ ද යන්න පැහැදිලි කරුණකි. වළාහක, කුම්භ, උදකරහද, මූසික, බලීවද්ද, රුක්ඛ, ආසිවිස වැනි සූත්‍රවලින් මෙම කරුණ තව දුරටත් පැහැදිලි වේ. ඇතැම් සැසඳීම් මගින් අතිශය සියුම් හාස්‍යයක් මෙන්ම තියුණු සමාජ විවරණයක් සිදු කරණු ලබයි.

සමාජ සංස්ථාවේ විවිධ ස්ථර නියෝජනය කරන අය බුදුන් වහන්සේගේ අවධානයට භාජනය වී ඇත. ඔවුන් පිළිබඳව කරනු ලබන විග්‍රහ ශ්‍රාවකයාගේ අවබෝධය තියුණු කෙරේ. නිදසුන් වශයෙන් තික නිපාතයේ පඨමපාපණික සූත්‍රයේ වෙළෙන්දෙකු දියුණු නොවීමට හේතු වන කරුණු තුනක් දක්වා ඇත. එනම් පෙරවරුවෙහි ව්‍යාපාර කටයුතුවල විධිමත් ලෙස නො යෙදීම, දහවල් හා සවස් කාලයෙහි විධිමත් ලෙස කටයුතුවල නො යෙදීම, මෙයට බලපාන බව කියැවේ. එසේම දුතියපාපණික සූත්‍රයෙහි ඉතා ඉක්මණින් දියුණු වීමට ඔහු තුළ තිබිය යුතු ගුණාංග තුනක් ද දක්වා ඇත. 1. ඇස් ඇත්තෙකු වීම (චක්ඛුමා) 2. දක්ෂ වීම (විධුරො) 3. වාසනා ගුණය ඇත්තෙකු වීම (නිස්සයසම්පන්නො) යනු ඒ තුනයි. දක්ෂ වෙළෙන්දාට පාරිභෝගික භාණ්ඩවල ගුණාත්මකභාවය පිළිබඳ දැනුමක් තිබිය යුතු ය. එය විකිණීමේ දී එහි නියම වටිනාකම පිළිබඳවත් විකිණීමෙන් ඇති වන ලාභය පිළිබඳවත් දැනුමක් තිබිය යුතු ය. මෙම කරුණුවලින් යුක්ත තැනැත්තා ඇස් ඇත්තා යන්නෙන් අදහස් වේ. මෙම දැනුම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔහු සුලභ තැනකට ගොස් භාණ්ඩ මිළ දී ගැනීමටත් දුර්ලභ ස්ථානයකට ගොස් ඒවා විකිණීමටත් දක්ෂයෙකු විය යුතු ය. මෙම කුශලතාව විධුර යන්නෙන් අදහස් වේ. තවද ධනවත් ප්‍රභූන් මොහුගේ දක්ෂතාව හා ගුණවත් බව හා විශ්වසනීයත්වය කෙරේ පැහැදී එයින් දියුණු වී අඹුදරුවන් ද පෝෂණය කොට වරින් වර තම මුදල ගෙවීමට ආධාර කෙරේ නම් මෙහි එය නිස්සයසම්පන්නතාව හෙවත් වාසනා ගුණය ලෙස දක්වා ඇත. ව්‍යාපාරිකයෙකුට භෞතික දියුණුව සලසා ගැනීමට උපකාර වන මෙම කරුණු ශ්‍රාවකයන්ට ද අදාළ කොට දේශනා කරන ලද්දේ අධ්‍යාත්මික දියුණුව සලසා ගැනීමට ය.

## භණ්ඩගාම හා චක්ක වග්ග

අංගුත්තර නිකායේ වර්ග විසි අටකින් සමන්විත චතුක්ක නිපාතයේ පළමු වන වර්ගය භණ්ඩගාම වර්ගය වන අතර සිවු වන වර්ගය චක්ක වර්ගය වේ. මෙම හැම වර්ගයකම සූත්‍ර දහයක් අන්තර්ගත වන හෙයින් සමස්ත චතුක්කනිපාතයේ අන්තර්ගත සූත්‍ර සංඛ්‍යාව සූත්‍ර 280 ක් විය යුතු ය. මෙයින් භණ්ඩගාම වග්ගයේ අනුබුද්ධ, පපතිත, පඨමබත, දුතියබත, අනුසොත, අප්පස්සුත, සොභන, වෙසාරජ්ජ, තණ්හුප්පාද හා යොග යන සූත්‍ර දහයක් අන්තර්ගත ය. චක්කවර්ගය චක්ක, සඞ්ගහවත්ථු, සීහ, අග්ගප්පසාද, සීහ, දොණ, අපරිහානිය, පතිලීන, උජ්ජය, උදායී යන සූත්‍ර දහයෙන් යුක්ත ය. භණ්ඩගාම වග්ගය එනමින් හඳුන්වා ඇත්තේ එහි පළමු සූත්‍රය වන වන අනුබුද්ධ සූත්‍රය දේශනා කරන ලද ස්ථානය සැලකිල්ලට ගැනීමෙනි. එම සූත්‍රය දේශනා කොට ඇත්තේ වජ්ජි ජනපදයෙහි භණ්ඩ ග්‍රාමයේ දී ය. ඇතැම්විට මෙහි ඇතුළත් සූත්‍රවලින් වැඩි ප්‍රමාණයක් එහි දී දේශනා කළ ඒවා විය හැකි ය. චක්ක සූත්‍රය එනමින් හඳුන්වා ඇත්තේ එහි මුල්ම සූත්‍රයේ නාමය සැලකිල්ලට ගැනීමෙනි. මෙකී නාම දැක්වීම ත්‍රිපිටකයේ වෙනත් නිකාය ග්‍රන්ථයන්හි ද අනුගමනය කරන ලද්දකි. මෙම වර්ග දෙකම අධ්‍යාත්මික ජීවිතයක් ගත කිරීමට හේතුභූත වන ධර්ම කරුණුවලින් මෙම වර්ග දෙකම පරිපූර්ණ වේ. භණ්ඩගාම සූත්‍රයේ මුල්ම සූත්‍රයේ බුදුන් වහන්සේ මෙසේ වදාරා ඇත. ‘මහණෙනි, ආර්ය වූ සීල සමාධි ප්‍රඥා යන තුන පිළිබඳ අවබෝධ නො කිරීම හේතුන් මම ද ඔබලා ද සංසාරයෙහි දීර්ඝ කාලයක් සැරිසැරුවෙමු.’ යනුවෙනි. සාංසාරික ප්‍රවෘත්තිය නවතාලීම අධ්‍යාත්මික ජීවිතයක් ගෙවීමේ අරමුණ ඇති කවරෙකුගේ වුවත් මූලික අභිලාෂය වේ. එහෙයින් පුද්ගලයෙකු සීලවන්ත විය යුතුය. ඉන් අනතුරුව චිත්ත සමාධිය පුරුදු පුහුණු කළ යුතුය. මෙම පසුබිම ඔහුට සත්වයා හා ලෝකය සෑදී පවතින නාම රූප ධර්මයන් විනිවිද දැකීමෙන් උපදනා ප්‍රඥාව ඇතිවේ. එසේම විමුක්තිය හඳුනා ගත යුතු ය. එම දැකීම ඇති පුද්ගලයාට සාංසාරික දුක්ඛ දොමනස්සයන්ගෙන් අත් මිදිය හැකි ය. එම කරුණු හතරෙන් යුක්ත නොවූ තැනැත්තා ශාසනයෙන් ගිලිහුණු පුද්ගලයෙකු ලෙස පපතිත සූත්‍රයේ හඳුන්වා ඇත.

මෙම ආර්ය මාර්ගය පෙන්වා දුන් ලොව එකම උතුමාණන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ය. එය සමාජගත කරන ලද්දේ තථාගත ශ්‍රාවකයන් විසිනි. එමෙන් ම සමාජික ජීවිතයේ දී කෙනෙකුට සදාචාර සම්පන්න ජීවන මාර්ගය පෙන්වා දෙනු ලබනුයේ මව්පියන් විසිනි. එම නිසා බුදුන් වහන්සේ, බුද්ධ ශ්‍රාවකයන්, මව හා පියා යන සිවු දෙනා ලෝකයේ ආචාරවිද්‍යාත්මක ජීවන ප්‍රතිපදාවේ නියාමකයන් ලෙස සැලකිය හැකි ය. එහෙත් සදාචාර විරෝධී මිසදිටුවෝ මෙම ගමන් මග පිරිහෙළා දක්වමින් ඉහත කී සිවු දෙනා කෙරෙහි ද වරදවා පිළිපදිති. එබඳු පුද්ගලයන් වැරදි ආත්මයක් පරිහරණය කරන්නවුන් ලෙසත් මරණින් මත අපායේ උපදින බවත් සූත්‍රයේ දැක්වේ. ගුණාත්මක වශයෙන් නැසුණු, හැරුණු, වැනසුණු යන තේරුම ඇති පඨමබත, දුතියබත යන සූත්‍ර විමසීමෙන් මේ බව ඉතා පැහැදිලි වේ. පුද්ගල චරිත සංවර්ධනයට අවශ්‍ය ධර්මමය වටිනාකමකින් යුතු සූත්‍රවලින් මෙම වර්ග දෙකම සමන්විත ය.

මේ අතර ලෞකික ජීවිතයේ දියුණුව පිළිබඳව ද බුදුදහම අමතක නො කරන බව දැක්වීමට අවශ්‍ය සූත්‍ර දේශනා මෙම වර්ග දෙකෙහි අන්තර්ගත වන බව කිව යුතු ය. නිදසුනක් ලෙස චක්ක වර්ගයේ පළමු වන සූත්‍රය වන චක්ක සූත්‍රයෙන් පෙන්වා දෙන්නේ ලෝකයේ මහත් සම්පත් ලබා ගැනීමට ඉවහල් වන කරුණු හතරක් ඇති බවයි. සුදුසු පෙදෙසක විසීම. සත්පුරුෂ ආශ්‍රය, සිත තැන්පත්ව තබා ගැනීම හා පෙර කළ පින් ඇති බව යන කරුණු හතර ඊට අයත් ය. මෙම කරුණුවලින් යුක්ත වූ තැනැත්තා භවභෝග සම්පත්වලින් නොබෝ කලකින් ම දියුණු වන බව ‘යෙහි සමන්නාගතා දෙවමනුස්සා න චිරස්සෙව මහන්තං වෙපුල්ලත්තං පාපුණාති භොගෙසු’ දක්වා ඇත. එසේම දෙවන සඞ්ගහ සූත්‍රයෙහි පුද්ගලයෙකු විසින් මෙම සම්පත් භුක්ති විඳිමින් දානය, ප්‍රියවචනය, අර්ථචරියාව හා සමානාත්මතාව යන කරුණුවලින් තමා හා සහජීවී ජීවීන් විෂයෙහි පිළිපැදිය යුතු ආකාරය දක්වා ඇත. ක්‍රි.ව. 6 සියවස සමාජික තත්වය උජ්ජය හා උදායී සූත්‍ර යාගය පිළිබඳ දක්වන විස්තරය හැදෑරීමෙන් පැහැදිලි වේ.

මේ ආකාරයෙන් විමසන විට අංගුත්තර නිකායේ ධර්මමය වැදගත්කමට අමතරව ඓතිහාසික සාමාජික ආචාරවිද්‍යාත්මක ආදී අනේකවිධ වටිනාකම් විද්‍යමාන වේ. බෞද්ධ භික්ෂුවකට ස්වකීය

ධර්මඥානය පුළුල් කර ගැනීමට අවශ්‍ය දේශනා මෙන්ම අධ්‍යාත්මික ප්‍රගමනයට ඉවහල් වන දේශනාවලින් ද මේ සූත්‍රාගත ඉගැන්වීම් නිසැකවම උපයෝගී වේ. ලෞකික ජීවිතයක් ගෙවන ගිහි ජනතාවට භෞතික දියුණුව දැහැමින් උපදවා ගන්නා ආකාරයත් එතෙකින් නො නැවතී අධ්‍යාත්මික දියුණුව ඇති කර ගන්නා ආකාරයත් මෙහි මැනවින් අන්තර්ගත වේ. අංගුත්තර නිකායේ ඒකදේශයක පරිවර්තනයක් වන මෙම කුඩා කෘතිය පාලි භාෂාව හදාරන සිසුන්ගේ අවශ්‍යතාවක් සපුරාලනු වස් සරකසුණු කෘතියක් වන අතර එයින් ඔවුන්ගේ භාෂාඥානය මෙන් ම ධර්මඥානය ද පුළුල් වනු නො අනුමාන ය. එසේම ඔවුන්ගේ දැහැමි සන්තෘෂ්ටිය ද උපදවනු ඇත.

මෙම කෘතිය කුඩා වුවත් බැඳි අකුරු මුද්‍රණය, සෝදු පත් බැලීම, පදරුත් නිවැරදිව පිහිටුවීම වැනි කර්තව්‍ය කිරීමෙහි ලා නන් අය නන් අයුරින් වෙහෙස විය. මෙහි පෙළ කියවීම හා සැසඳීම කළ විද්‍යොදය පිරිවෙණේ ශිෂ්‍ය **රම්මලේ සුමනරතන, සපුතන්තිරිකන්දේ නන්දරතන** යන හිමිවරුන්ටත් සෝදු පත් කියවීමෙන් අනුග්‍රහ කළ විද්‍යොදය පිරිවෙණේ ආචාර්ය රාජකීය **පණ්ඩිත පුස්සැල්ලෑවේ ඤාණරතන හිමි හා මතුරට පඤ්ඤානන්ද** හිමියන්ටත් නන් අයුරින් සහාය දක් වූ **අම්බල්නගොඩ සුමෙධානන්ද හිමියන්ටත්** හිතවත් **එස්. අයි. ගමගේ** ශූරීන්ටත් මුද්‍රණයෙන් සහාය දැක්වූ ගංගොඩවිල පැහිරිවත්තේ කොලිටි ප්‍රින්ටර්ස්හි අධිපතිතුමන් ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාව හා බුදුවදන ලිවීමෙන් අකුරක් පාසා ජනිත වන මහගු පින පවරමි.

මෙයට,

01. 07. 2008
මකුරුප්පේ ධම්මානන්ද හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය,
දළුගම.

# පටුන


| භණ්ඩගාම වර්ගය - පෙළ | පිටුව |
|---|---|
| 1. අනුබුද්ධ සුත්තං | 15 |
| 2. පපතිත සුත්තං | 16 |
| 3. පඨමබත සුත්තං | 17 |
| 4. දුතියබත සුත්තං | 19 |
| 5. අනුසොත සුත්තං | 21 |
| 6. අප්පස්සුත සුත්තං | 23 |
| 7. සොභන සුත්තං | 25 |
| 8. වෙසාරජ්ජ සුත්තං | 26 |
| 9. තණ්හුප්පාද සුත්තං | 28 |
| 10. යොග සුත්තං | 29 |
| **පදගතාර්ථ හා විවරණ** | |
| 1. අනුබුද්ධ සූත්‍රය හා විවරණය | 33 |
| 2. පපතිත සූත්‍රය හා විවරණය | 37 |
| 3. පඨමබත සූත්‍රය හා විවරණය | 40 |
| 4. දුතියබත සූත්‍රය හා විවරණය | 45 |
| 5. අනුසොත සූත්‍රය හා විවරණය | 50 |
| 6. අප්පස්සුත සූත්‍රය හා විවරණය | 54 |
| 7. සොභන සූත්‍රය හා විවරණය | 59 |
| 8. වෙසාරජ්ජ සූත්‍රය හා විවරණය | 61 |
| 9. තණ්හුප්පාද සූත්‍රය හා විවරණය | 66 |
| 10. යොග සූත්‍රය හා විවරණය | 67 |

## චක්ක වර්ගය - පෙළ


1. චක්ක සුත්තං 78
2. සඞ්ගහ සුත්තං 78
3. සීහ සුත්තං 79
4. අග්ගප්පසාද සුත්තං 81
5. වස්සකාර සුත්තං 82
6. දොණ සුත්තං 86
7. අපරිහානිය සුත්තං 88
8. පතිලීන සුත්තං 90
9. උජ්ජය සුත්තං 92
10. උදායි සුත්තං 93
පදගතාර්ථ හා විවරණ 94


## පදගතාර්ථ හා විවරණ


1. චක්ක සූත්‍රය හා විවරණය 95
2. සඞ්ගහ සූත්‍රය හා විවරණය 98
3. සීහ සූත්‍රය හා විවරණය 99
4. අග්ගප්පසාද සූත්‍රය හා විවරණය 104
5. වස්සකාර සූත්‍රය හා විවරණය 109
6. දොණ සූත්‍රය හා විවරණය 117
7. අපරිහානිය සූත්‍රය හා විවරණය 123
8. පතිලීන සූත්‍රය හා විවරණය 132
9. උජ්ජය සූත්‍රය හා විවරණය 137
10. උදායි සූත්‍රය හා විවරණය 142


# 1. අනුබුදධසුතතං

එවං මෙ සුතං: එකං සමයං භගවා වජ්ජිසු විහරති භණඩගාමෙ. තත්‍ර බො භගවා භිකඛූ ආමනෙතසි: භිකඛවො”ති. “භදනෙත”ති තෙ භිකඛූ භගවතො පචචසෙසාසුං. භගවා එතදවොච:

චතුනනං භිකඛවෙ ධමමානං අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමදධානං සනධාවිතං සංසරිතං මමඤෙචව තුමහාකඤච. කතමෙසං චතුනනං?

අරියසස භිකඛවෙ සීලසස අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමදධානං සනධාවිතං සංසරිතං මමඤෙචව තුමහාකඤච.

අරියසස භිකඛවෙ සමාධිසස අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමදධානං සනධාවිතං සංසරිතං මමඤෙචව තුමහාකඤච.

අරියාය භිකඛවෙ පඤඤාය අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමදධානං සනධාවිතං සංසරිතං මමඤෙචව තුමහාකඤච.

අරියාය භිකඛවෙ විමුතතියා අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමදධානං සනධාවිතං සංසරිතං මමඤෙචව තුමහාකඤච.

තයිදං භිකඛවෙ අරියං සීලං අනුබුදධං පටිවිදධං, අරියො සමාධි අනුබුදෙධා පටිවිදෙධා,

අරියා පඤඤා අනුබුදධා පටිවිදධා, අරියා විමුතති අනුබුදධා පටිවිදධා, උචඡිනනා භවතණ්හා, ඛීණා භවනෙතති, නත්ථි දානි පුනබභවො”ති. ඉදමවොච භගවා. ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා:

සීලං සමාධි පඤඤා ච, විමුතති ච අනුතතරා
අනුබුදධා ඉමෙ ධමමා, ගොතමෙන යසසසිනා

ඉති බුදෙධා අභිඤඤාය, ධමමමකඛාසි භිකඛුනං
දුකඛසසනතකරො සත්ථා, චකඛුමා පරිනිබබුතො”ති.

## 2. පපතිතසුතතං

චතුහි භිකඛවෙ ධමෙමහි අසමනනාගතො ‘ඉමසමා ධමමවිනයා පපතිතො’ති වුචචති. කතමෙහි චතුහි?

අරියෙන භිකඛවෙ සීලෙන අසමනනාගතො ‘ඉමසමා ධමමවිනයා පපතිතො’ති වුචචති. අරියෙන භිකඛවෙ සමාධිනා අසමනනාගතො ‘ඉමසමා ධමමවිනයා පපතිතො’ති වුචචති. අරියාය භිකඛවෙ පඤඤාය අසමනනාගතො ‘ඉමසමා ධමමවිනයා පපතිතො’ති වුචචති. අරියාය භිකඛවෙ විමුතතියා අසමනනාගතො ‘ඉමසමා ධමමවිනයා පපතිතො’ති වුචචති. ඉමෙහි ඛො භිකඛවෙ චතුහි ධමෙමහි අසමනනාගතො ‘ඉමසමා ධමමවිනයා පපතිතො’ති වුචචති.

චතුහි භිකඛවෙ ධමෙමහි සමනනාගතො ‘ඉමසමා ධමමවිනයා අපපතිතො’ති වුචචති. කතමෙහි චතුහි?

අරියෙන භිකඛවෙ සීලෙන සමනනාගතො



‘ඉමසමා ධමමවිනයා අපපතිතො’ති වුචචති. අරියෙන භිකඛවෙ සමාධිනා සමනනාගතො ‘ඉමසමා ධමමවිනයා අපපතිතො’ති වුචචති. අරියාය භිකඛවෙ පඤඤාය සමනනාගතො ‘ඉමසමා ධමමවිනයා අපපතිතො’ති වුචචති. අරියාය භිකඛවෙ විමුතතියා සමනනාගතො ‘ඉමසමා ධමමවිනයා අපපතිතො’ති වුචචති.

ඉමෙහි ඛො භිකඛවෙ චතුහි ධමෙමහි සමනනාගතො ඉමසමා ධමමවිනයා අපපතිතො’ති වුචචති.

චුතා පතනති පතිතා, ගිදධා ච පුනරාගතා
කතං කිචචං රතං රමමං, සුඛෙනානවාගතං සුඛනති.

## 3. පඨමඛතසුතතං

චතුහි භිකඛවෙ ධමෙමහි සමනනාගතො බාලො අබ්‍යතෙතා අසපපුරිසො ඛතං උපහතං අතතානං පරිහරති, සාවජෙජා ච හොති සානුවජෙජා ච විඤඤූනං, බහුඤච අපුඤඤං පසවති. කතමෙහි චතුහි?

අනනුවිචච අපරියොගාහෙතවා අවණ්ණාරහසස වණ්ණං භාසති, අනනුවිචච අපරියොගාහෙතවා වණ්ණාරහසස අවණ්ණං භාසති, අනනුවිචච අපරියොගාහෙතවා අපපසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති, අනනුවිචච අපරියොගාහෙතවා පසාදනීයෙ ඨානෙ අපපසාදං උපදංසෙති

ඉමෙහි ඛො භිකඛවෙ චතුහි ධමෙමහි සමනනාගතො බාලො අබ්‍යතෙතා අසපපුරිසො ඛතං උපහතං අතතානං පරිහරති, සාවජෙජා ච හොති සානුවජෙජා ච විඤඤූනං, බහුඤච අපුඤඤං පසවති.